"කාර්යක්ෂමතාවයෙන් යුත් ඵලදායී පළාත් සභා රාජ්‍ය සේවයක්"

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ஊவா மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு
Uva Provincial Council Public Service Commission

අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව බදුල්ල. இல 14/4, பீலிபொத்தகம வீதி, பிங்கராவ, பதுளை. No 14/4, Peelipothagama Road, Pinarawa, Badulla.

මගේ අංකය / எனது இல / My No. 3/3/2/6 (312)
ඔබේ අංකය / உமது இல / Your No. ........................
දිනය / திகதி / Date 2026.10.19

ඌව පළාතේ ප්‍රධාන ලේකම්,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්,
සභා ලේකම්, ඌව පළාත් සභාව,
අමාත්‍යාංශ ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන්,

## ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ II හා I ශ්‍රේණි වල නිලධාරීන් සඳහා වන දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2026

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී II හා I වන ශ්‍රේණිවලට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග, අනුමත සේවා ව්‍යවස්ථාවේ ඇති විධිවිධානයන්ට අනුකූලව ඉදිරියේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ සඳහා ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ II හා I වන ශ්‍රේණිවල නිලධාරීන්ට ඉල්ලුම් කළ හැකි අතර, අදාළ විභාගය සඳහා ඉදිරිපත් වන අයදුම්පත් ප්‍රමාණය අනුව විභාගය බදුල්ල නගරයේ පමණක් පවත්වන්නේද, එසේ නොමැතිනම් බදුල්ල හා මොනරාගල යන නගරවල පමණක් පවත්වන්නේද යන්න තීරණය කරනු ලැබේ.

03. **පළමුවරට විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ.** එසේ වුවත් ඉන්පසු වාර වල දී විභාගය සඳහා පෙනී සිටින I ශ්‍රේණියේ අපේක්ෂකයින් විසින් **සම්පූර්ණ විභාගය සඳහා පෙනී සිටින්නේ නම් රු.200.00 ක මුදලක් ද,** II ශ්‍රේණියේ අපේක්ෂකයින් විසින් **සම්පූර්ණ විභාගය සඳහා පෙනී සිටින්නේ නම් රු.400.00 ක මුදලක් ද, එක් විෂයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු.200.00 ක මුදලක් ද** විභාග ගාස්තු වශයෙන්, ඌව පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට **"ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13"** ට බැර වන පරිදි ගෙවිය යුතුය. එසේම මොනම කරුණක් යටතේ වුව ද ඉහත විභාග ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. මෙම විභාග පැවැත්වීම සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් විය යුතු වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

05. මෙම විභාග සඳහා ඉදිරිපත් වන නිලධාරීන්, https://exams.psc.up.gov.lk/ වෙබ් සබැඳිය ඔස්සේ මාර්ගගත අයදුම් කිරීමේ ප්‍රවේශය වෙත පිවිස **2026.11.06 දින හෝ ඊට පෙර** අදාල විභාගය සඳහා මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කළ යුතු අතර, එම අයදුම්පත සම්පූර්ණ කර පද්ධතියට යොමු කළ (Submit) පසුව අයදුම්පතේ මෘදු පිටපත බාගත (මෙනුවෙහි Application වෙත පිවිසෙන්න) කර ගත යුතුය. බාගත කර ගන්නා ලද අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන විභාගය සඳහා විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම මුදල් ගෙවන ලද කුවිතාන්සිය ද නියමිත ස්ථානයේ අලවා, අදාල අයදුම්පත තම ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2026.11.13** දින හෝ ඊට පෙර **"ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4,**

02 පිටුවට........

ගරු සභාපතිතුමා / கௌ.தவிசாளர் / Hon. Chairman 055 - 2222150
ලේකම් / செயலாளர் / Secretary 055 - 2223482
පොදු / பொது / General 055 - 2222400
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst.Secretary 055 - 2225148, 055 - 2232857(Exam)
පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer 055 - 2222400
Fax - 055-2232858
Website - www.psc.up.gov.lk
E-mail - uppscb@gmail.com

**පිලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ඌව පළාත් සහා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ II/I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන/තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026"** යනුවෙන් සඳහන් කරන්න.

06. එසේම, **මාර්ගගත පද්ධතිය ඔස්සේ විධිමත්ව සම්පූර්ණ නොකරන ලද හා අසම්පූර්ණ තොරතුරු සහිත හෝ වැරදි සහිත, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසු ඉදිරිපත් කරනු ලබන සියලු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** ඉල්ලුම්පත්‍රයේ හා මුදල් ගෙවා ලබා ගත්තා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

07. සියලු විභාග අපේක්ෂකයින් විභාග දිනයේ දී තම අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.
III. වලංගු රියදුරු බලපත්‍රය.

08. එක් එක් ශ්‍රේණිවලට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා වන ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව හා ඊට අදාළ විෂයය නිර්දේශයන් පහත දැක්වේ. එසේම, කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතු වේ.

**(අ) සංවර්ධන නිලධාරී II වන ශ්‍රේණිය**

මෙම පරීක්ෂණය II වන ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගත වීමට පෙර සමත් විය යුතුය.

| විෂය අංකය | විෂයය හා විෂයය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|
| 01. | **ආයතන සංග්‍රහය, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය හා ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහය**<br><br>ආයතන සංග්‍රහයේ VI, VII, VIII, XII, XIII, XIV, XVII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXIII පරිච්ඡේද<br>ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති<br>ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහයේ I හා II පරිච්ඡේද | පැය 02 | 100 |
| 02. | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභා මුදල් රීති සංග්‍රහය**<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ I, II, III, IV, V පරිච්ඡේද හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පැය 02 | 100 |

**(ආ) සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණිය**

මෙම පරීක්ෂණය I වන ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගත වීමට පෙර සමත් විය යුතුය.

| විෂය අංකය | විෂයය හා විෂයය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|
| 01. | **ව්‍යාපෘති කළමනාකරණය**<br>I. ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම<br>II. ව්‍යාපෘති කළමනාකරණය<br>III. ව්‍යාපෘති චක්‍රය<br>IV. ව්‍යාපෘති පිළියෙල කිරීම සහ විග්‍රහ කිරීම<br>V. ව්‍යාපෘති ඇගයීම<br>• පිළිගෙවුම් කාලය<br>• ශුද්ධ වර්තමාන වටිනාකම<br>• අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය<br>• වාර්ෂික සාමාන්‍ය ඉපැයුම් අනුපාතය | පැය 03 | 100 |

| | | | |
|---|---|---|---|
| | VI. ව්‍යාපෘති සංවිධානය<br>VII. ඡායා මිල යොදා ගැනීම | | |

09. මෙම විභාග සිංහල හා දෙමළ මාධ්‍යයන් ගෙන් පවත්වනු ලැබේ. අයදුම්කරුවන් ඉදිරිපත් වන විෂයයන් සියල්ලම සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර, කිසිදු හේතුවක් මත විභාගයට ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කරනු නොලැබේ.

10. විභාග පැවැත්වීමට අවම වශයෙන් දෙසතියකට පෙර ප්‍රවේශපත්‍ර ඊමේල් (Email) මඟින් එවනු ලබන අතර, විභාගයට අයදුම් කිරීමේදී විද්‍යුත් තැපැල් ලිපිනය (Email Address) නිවැරදිව සඳහන් කළ යුතුය. විභාග දිනට සතියකට පෙරවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අදාළ ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ද, මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපතක් ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා වට්ස්ඇප් (WhatsApp) අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීමක් කළ යුතු වේ. මීට අමතරව https://exams.psc.up.gov.lk/admission/ සබැඳිය මගින්ද විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීමට පහසුකම් සලසනු ඇත.

11. මේ පිළිබඳව ඔබ ආයතනයට/දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන ඌව පළාත් සභා රාජ්‍ය සේවය යටතේ පත්වීම් ලද/ඌව පළාත් සභා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද සියලුම සංවර්ධන නිලධාරි I හා II ශ්‍රේණි වල තනතුරු දරණ නිලධාරීන්/නිලධාරිණියන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

12. මෙම විභාගය පැවැත්වීම/නොපැවැත්වීම හෝ මෙම නිවේදනය මඟින් ආවරණය නොවන කිසියම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගැනීමේ අයිතිය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

(එල්.ඒ.සෝමරත්න)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව